ගොවි බිරියගේ නුවණ

1.1 පෙළ පොතේ ඇති ජනකතාව නිහඬව කියවන්න.

1.2 සිද්ධිමාලාව ගොඩනගන්න.

- ගොවියා හා ව්‍යාඝ්‍රයා හමුව
- ගොවියා හා බිරිය අතර කතාබහ
- ව්‍යාඝ්‍රයා හා බිරිය අතර කතාබහ

➢ මෙම අවස්ථා සඳහා දෙබස් ගොඩනගන්න.

➢ එම දෙබස් හැඟීම් දනවන අයුරින් උච්චාරණය කරන්න.

<u>ජනකතාවක ලක්ෂණ</u>

i. කතා කරන භාෂාවෙන් නිර්මාණය කර තිබීම.
ii. මිනිසුන්, සතුන්, ගස්-වැල් කතා කිරීම.
iii. විවිධ ආදර්ශ ඇතුළත්වීම.
iv. අතිශයෝක්තියෙන් ඉදිරිපත් කිරීම් ඇතුළත් වීම.
v. අභව්‍ය සිදුවීම් ඇතුළත් වීම.

<u>ජනකතාවක් ඉදිරිපත් කරන ආකාරය</u>

i. "ඔන්න එකෝමත් එක කාලෙක"කියල ආරම්භ කිරීම.
ii. අසන්නන් හූමිටි තැබීම.
iii. කතාව අතරතුර අසන්නන් ප්‍රශ්න ඇසීම.
iv. කතාව ඉදිරිපත් කරන්නා කතා ශෛලියෙන්, මුහුණේ ඉරියව්වලින් හා හැඟීම්වලින් චරිතාරෝපණය වී ඉදිරිපත් කිරීම.

➢ වෙනත් ජනකතාවක් සඳහා දෙබස් නිර්මාණය කරන්න.

➢ එම දෙබස් නාට්‍යානුසාරයෙන් උච්චාරණය කරමින් පටිගත කර සවන් දෙන්න.

<u>ජනකතා එකතුවක් සකසන්න.</u>

උදාහරණ : -

i. අන්දරේගේ කතා
ii. ගමරාළගේ කතා